# පාසල්වල ඵලදායිතාව ඉහළ නැංවීම සඳහා එස් පහ සංකල්පය යොදා ගන්නා ආකාරය පිළිබඳ අධ්‍යයනයක්

University of Colombo Sri Lanka
29 DEC 2014
Colombo - 03
16 JAN 2015

පී. එන්. රාජපක්ෂ

2008/M·phil/12

විශේෂ ශාස්ත්‍රවේදී උපාධි (ගෞරව) රුහුණ විශ්වවිද්‍යාලය

පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා (සම්මාන) කොළඹ විශ්වවිද්‍යාලය

අධ්‍යාපනපති උපාධි කොළඹ විශ්වවිද්‍යාලය

ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවය 1

University of Colombo Sri Lanka Library

UCLIB
586102

අධ්‍යාපන දර්ශනපති උපාධිය සඳහා කොළඹ විශ්වවිද්‍යාලයේ

අධ්‍යාපන පීඨයට ඉදිරිපත් කරනු ලබන ස්වාධීන නිබන්ධය - 2014

## සංක්ෂිප්තය

පාසල් අධ්‍යාපන පද්ධතිය සඳහා ජාතික මට්ටමින් තීරණය කළ පොදු අරමුණු හා මූලික නිපුණතා ඇත. එහෙත් දිස්ත්‍රික්ක, පාසල් වර්ග සහ පාසල්වල පිහිටීම ආදී විවිධ විචල්‍යයන් අනුව එක් එක් පාසලක් මගින් ලබා දෙන අධ්‍යාපන ක්‍රියාවලියේ ගුණාත්මකභාවයේ හා ඵලදායිතාවේ වෙනස්කම් දක්නට ලැබේ. එහෙයින් පාසල්වල ගුණාත්මකභාවය සහ ඵලදායිතාව වැඩි කළ හැකි විවිධ ක්‍රමවේද පිළිබඳ ව අවධානය යොමු කිරීමට ද සිදු ව තිබේ. එවන් ක්‍රමවේදවලින් එකක් ලෙස එස් පහ සංකල්පය හඳුන්වා දිය හැකිය. මෙම සංකල්පය පාසල තුළ ක්‍රියාත්මක කිරීමේදී පාසල් පාර්ශ්වකරුවන් මනා කැපවීමකින් සාමූහික ව කටයුතු කළ යුතුය. පාසලක් සාර්ථක හෝ අසාර්ථක වීමට විදුහල්පතිවරයාගේ නායකත්වය සෘජු බලපෑමක් ඇති කරයි. එම නිසා ජාතික මට්ටමේ අරමුණු ඉටු කර ගනිමින් මූලික නිපුණතා අත්පත් කර ගැනීමට ශිෂ්‍ය ප්‍රජාව පෙළඹවීම සඳහා විදුහල්පතිවරයා විසින් තම පාසල මෙහෙයවිය යුතුය.

අධ්‍යාපන ක්‍රියාවලියේ ගුණාත්මකභාවය හා ඵලදායිතාව වර්ධනය කිරීම සඳහා ආකර්ශණීය පාසල් පරිසරයක් නිර්මාණය කිරීම ද වැදගත් වේ. මේ සඳහා ගුරු, සිසු සහ ප්‍රජා දායකත්වය උපරිම වශයෙන් ලබාගත යුතුය. බොහෝ පාසල්වල භෞතික හා මානව සම්පත් කළමනාකරණය මැනවින් සිදු නොවේ. එහෙයින් මානව සම්පත් නිසි පරිදි කළමනාකරණය කළ යුතු වේ. මෙහිදී පාසලට සම්බන්ධ ප්‍රජාව සමඟ ද මනා සබැඳියාවක් ඇති කර ගනිමින් ඔවුන් සතු ශක්තීන් පාසල් ඵලදායිතාව ඉහළ නැංවීම සඳහා යොදා ගත යුතුය. අධ්‍යාපනයේ ගුණාත්මකභාවය හා ඵලදායිතාව ඉහළ නැංවීමේදී අධ්‍යාපනික සාධනය සම්බන්ධයෙන් ද විදුහල්පතිවරුන් ඉතා කැපවීමෙන් කටයුතු කළ යුතු වේ. එසේම ඵලදායිතාව ඉහළ නැංවීම සඳහා පාසල තුළ විවිධ ක්‍රියාදාමයන් දියත් කිරීමේදී විදුහල්පතිවරුන්ට අභියෝගයන්ට සාර්ථක ව මුහුණ දී ජය ගැනීමට ද සිදු ව තිබේ.

ඵලදායි පාසල් පිළිබඳ විවිධ රටවල කරන ලද පර්යේෂණ අනාවරණ අනුව ඵලදායිතාව පිළිබඳ නිශ්චිත නිර්වචන හෝ සංඛ්‍යාමය දත්ත ඉදිරිපත් කළ නොහැකිය. එසේම ඵලදායිතාව ඉහළ නැංවීමට එස් පහ සංකල්පය යොදා ගත හැකි ආකාරය සම්බන්ධව සෘජු ව පර්යේෂණ සිදු කර නොමැත. එහෙත් ඵලදායිතාව සම්බන්ධව සිදු කර ඇති පර්යේෂණ ඇසුරෙන් ද ඵලදායිතා ලේකම් කාර්යාලයීය න්‍යායාත්මක තොරතුරු පදනම් කර ගනිමින් ද තම පර්යේෂණය මෙහෙයවීමට පර්යේකයාට හැකි විය.

පාසල්වල ඵලදායිතාව ඉහළ නැංවීමට එස් පහ සංකල්පය යොදා ගන්නා ආකාරය අධ්‍යයනය කිරීම මෙහි ප්‍රධාන පරමාර්ථය විය. එම පරමාර්ථය ඉටු කර ගැනීම සඳහා විස්තරාත්මක පර්යේෂණ ක්‍රමය යොදා ගැණින. මෙහිදී දත්ත රැස් කර ගැනීම සඳහා ප්‍රශ්නාවලි, සම්මුඛ සාකච්ඡා, නිරීක්ෂණ නියමාවලි හා වාර්තා විශ්ලේෂණ වැනි ක්‍රම ශිල්ප භාවිත කෙරිණ. දත්ත විශ්ලේෂණය සඳහා සංඛ්‍යා, ප්‍රතිශත සහ මධ්‍ය අගය ද සන්සන්දනය කිරීම සඳහා ප්‍රස්තාර ද යොදා ගැණින. මෙහිදී කෑගල්ල, කොළඹ හා ගාල්ල යන දිස්ත්‍රික්ක නියෝජනය වන පරිදි ඵලදායිතා සම්මානලාභී පාසල් 15කින් යුක්ත සහේතුක නියැදියක් තෝරා

පාර්ශ්වකරුවන් 220 දෙනෙකුගෙන් දත්ත හා තොරතුරු ලබා ගැණින. එම දත්ත පර්යේෂණ අරමුණු ඔස්සේ දිස්ත්‍රික්කය, පාසල් වර්ගය හා පිහිටීම යන විචල්‍යයන් තුන අනුව විශ්ලේෂණය කරන ලදී.

මෙම අධ්‍යයනය ප්‍රධාන පර්යේෂණ අරමුණු පහකින් සමන්විතය. පළමු අරමුණ යටතේ එස් පහ සංකල්පයට අනුව සකස් කළ ඵලදායිතා සම්මානලාභී පාසල්වල භෞතික පරිසරය සැකසී ඇති ස්වභාවය පිළිබඳ ව සොයා බලන ලදී. භෞතික පරිසරය ප්‍රසන්න ව තබා ගැනීමට විදුහල්පතිවරුන් විශාල කැපවීමක් සිදු කර තිබිණ. පිරිසිදුකම මෙම පාසල්වල ඉතා ඉහළ මට්ටමින් ක්‍රියාත්මක විය. විනය හා පුහුණුව සිසුන්ගේ පෞද්ගලික ජීවිතයට බද්ධ වී තිබූ බව නිරීක්ෂණය කළ හැකි විය. සම්මානලාභී පාසල්වල සිසු නිර්මාණශීලිත්වය එළි දක්වන අයුරින් කඩදාසි නිෂ්පාදන ඒකක, බස් රථය තුළ සංගීත කාමරය, වී බිස්ස හා වැසි ජල ටැංකි වැනි සුවිශේෂ අංගලක්ෂණ ඉදිකර තිබිණ. ආකර්ශණීය පාසල් පරිසරය ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය වැඩි දියුණු කිරීමට හේතු වූ බව ද මෙම පර්යේෂණයෙන් අනාවරණය විය.

දෙවන අරමුණ යටතේ විදුහල්පතිවරුන් විසින් මානව සම්පත් කළමනාකරණය සඳහා යොදා ගත් ක්‍රමවේද පිළිබඳ ව විමසා බලන ලදී. කාල කළමනාකරණය සිදු වන බව ආදර්ශයෙන් පෙන්වීම, අවම නිවාඩු ලබන ගුරුවරුන් ඇගයීම, ධනාත්මක ආකල්ප ඇතිව කටයුතු කිරීම යනාදී ක්‍රමවේදයන් විදුහල්පතිවරුන් අනුගමනය කර තිබූ බව අනාවරණය විය. මෙම පාසල් නායකත්වය යටතේ තෘප්තිමත් ව තම සේවය ඉටු කළ හැකි බවත් විදුහල්පති කළමනාකරණ ශෛලිය ගුරුවරුන් උපස්ථම්භනය කිරීමට හේතු වී තිබූ බවත් අනාවරණය විය. ගුරු සාකච්ඡා, උදෑසන රැස්වීම් හා පාසල් සංවර්ධන සමිති රැස්වීම්වලදී ඇගයීමට ලක්වීමෙන් ගුරුවරුන් තෘප්තිමත් වී තිබිණ.

මෙහි තෙවන අරමුණ යටතේ එස් පහ සංකල්පය ක්‍රියාත්මක කිරීමට ප්‍රජාව ලබා දුන් සහයෝගය පිළිබඳ ව සොයා බැලිණ. විදුහල්පතිවරුන් ප්‍රජා සහාය උපරිම මට්ටමින් ලබා තිබූ බව අනාවරණය විය. ප්‍රජාව පාසලට සම්බන්ධ කර ගැනීමට රුක් රෝපණ වැඩසටහන්, ආපදා සහන, ආගමික කටයුතු සහ ආකල්ප සංවර්ධන වැඩමුළු වැනි අවස්ථා සම්පාදනය කර තිබිණ. ප්‍රජාව සතු සුවිශේෂ හැකියා ද උපරිම ලෙස දායක කරගෙන තිබිණ.

සිව්වන අරමුණ යටතේ මෙම පාසල්වල අධ්‍යාපනික සාධනය ඉහළ යාමට එස් පහ සංකල්පය ක්‍රියාත්මක කිරීම හේතු වී තිබේදැයි විමසා බැලිණ. අධ්‍යාපනික සාධන මට්ටම සමඟ ප්‍රසන්න පාසල් පරිසරය, විදුහල්පතිවරයා සතු මානව සම්පත් කළමනාකරණ හැකියාවන්, පාසල් ප්‍රජාව සතු කුසලතා උපයෝගී කරගෙන පාසලට ලබා දෙන ශක්තීන්වල ඍජු සම්බන්ධතාවක් පවතී. ඵලදායිතා සම්මානලාභී පාසල්වල ඵලදායිතා සංකල්ප ක්‍රියාත්මක කිරීම නිසා අර්ධ නාගරික පාසල්වල උසස් පෙළ හා පස්වන ශ්‍රේණියේ ශිෂ්‍යත්ව විභාග ප්‍රතිඵල මෙලෙස වැඩි වූ බව අනාවරණය විය.

පස්වන අරමුණ යටතේ පාසල්වල ඵලදායිතා සංකල්ප ක්‍රියාත්මක කිරීමේදී විදුහල්පතිවරුන් මුහුණ දෙන අභියෝග සහ එම අභියෝග ජය ගන්නා ආකාරය විමසා බැලිණ. තමා දරණ ආකල්ප වෙනස් කිරීමේ සහ වෙනස්වීම්වලට අකැමැත්ත මෙන්ම වැඩ

කරන්නන් අවඥාවට ලක් කිරීම වැනි අභියෝගවලට විදුහල්පතිවරුන් මුහුණ දී තිබූ බව අනාවරණය විය. එම අභියෝග ජය ගැනීමට විදුහල්පතිවරුන් සතු ආරම්භක ශක්තිය යෙදීම, ඵලදායිතාව හා අධ්‍යාපනික සාධනය ඒකාබද්ධ කිරීම, සිත් ගන්නා සුලු පාසල් පිරියතක් නිර්මාණය කිරීම සහ විවේචන ආශිර්වාද ලෙස සැලකීම යනාදී ක්‍රමවේද ඔවුන් අනුගමනය කර තිබිණ.

ඉහත පර්යේෂණය මගින් අනාවරණය කරගත් කරුණු ශ්‍රී ලංකාවේ ඕනෑම පාසලක විදුහල්පතිවරුන්ට තම පාසල තුළ එස් පහ සංකල්පය ක්‍රියාත්මක කිරීමටත්, ප්‍රසන්න පාසල් පරිසරයක් ගොඩනැගීමටත් ඉවහල් වනු ඇත. එලෙසම විදුහල්පතිවරුන්ට මානව සම්පත් මැනවින් කළමනාකරණය කිරීම සඳහා ප්‍රජා සම්බන්ධතා ද උපයෝගි කර ගෙන අභියෝග ජය ගනිමින් පාසල්වල ඵලදායිතාව ඉහළ නැංවීමට ද මෙම පර්යේෂණ අනාවරණ යොදා ගත හැකිය. අවසාන වශයෙන් වැසී යාමේ තර්ජනයට ලක් ව ඇති ග්‍රාමීය දුෂ්කර පාසල්වල ඵලදායිතාව ඉහළ නැංවීමේ ක්‍රම ශිල්පයක් ලෙස එස් පහ සංකල්පය සම්බන්ධ ව සිදු කළ හැකි අධ්‍යයන පිළිබඳ ව වැඩිදුර පර්යේෂණ සඳහා යෝජනා ඉදිරිපත් කර ඇත.

Abstract

Despite the popular parlance of equal educational opportunities in Sri Lanka sysytem of education there has been a disparity in teams of quality and productivity of education imparted in school. Hence , the exploration of methodologies to enhance the productivity in the school system is of greater importance. The 5 as concept could be introduced as one of those methodologies. Therefore , it is incumbent upon the concerned parties in the school to exercise their dedication and commitment wholeheartedly when implementing this concept in the school system. It is in this context that the principal's leadership bears much significance.

It is quite impossible to provide perfect definitions or statistical data for the term "productivity" based on the research projects conducted in various counties regarding productive school. At the same time there have been no records of empirical evidence of researches solely aimed at exploring ways and means of enhancing productivity. Nevertheless, this researcher has been able to conduct her research with the help of various research carried out on productivity by herself based on the theoretical evidence of the National Productivity Secretarial.

The main objective of this is to study how the 5s concept could be utilized to boost the productivity in school. In order to achieve the objectives of this purpose, different methodologies such as questionnaires, interviews, observation schedules, report analysis etc. were adopted. Data analysis was carried out with figures (numerical) Percentages and graphs.

This study was conducted in two phases so as to follow the quantitative and qualitative aspects of a research. Substantial Information was collected on background information at the first stage and the second stage focused on collecting information on objectives. In this exercise, data information was recorded from 220 stakeholders representing 15 productivity Award winning school encompassing Colombo,Galle and Kagalle districts.

University of Colombo Library Sri Lanka

Thus the data and information collected from different sources were analyzed under three variables viz. Type of school , district and the geographical location.

This study encompasses five main objectives. According to the first objective principals of the productivity awards winning school, under the 5s concept , had committed immensely to maintain the congenial physical atmosphere in their school; cleanliness of these schools manifested at the degree of highest level. It was observed how discipline and orderliness had effectively incorporated into the individual life of the child showcasing the creativity of award winning school students, there were significant contributions like paper producing units, music room inside the bus, paddy barn and rain water collecting tanks.

It was thus revealed in the study that the attractive school environment would enhance the teaching – learning process considerably.

The second objective concentrated on methodologies to assess how school principals set precedence on time management as a means of human resource management evaluating the teachers who have taken the least number of leave and promoting positive attitudes towards work. The teachers claimed that they could discharge their duties satisfactorily under such school management. Thus the style of management by the school principals has undoubtedly become a motivating factor for the teachers.

Teachers felt satisfied with their work when they were constantly evaluated at the staff meeting, morning assembly and the meeting of school development society.

The third objective looked into the co-operation extended by the community to implement the 5s concept. Principal's commitment registered the highest level of contribution. To get the community involved in the implementation of this concept, several programmers were conducted and thus opportunities were created. Tree planting campaigns, disaster relief programmes, religious events and attitude development workshops were among the highlights. For this to workout, exclusive potentials of the community was harnessed.

The fourth objective saw the proficiency level of education being enhanced considerably. It was revealed that the results of the Advanced Level Examination and the Grade Five scholarship Examination recorded an improvement in the semi urban schools.

The fifth objective explored into the unwillingness on the part of principals to change their attitudes, reluctance to welcome positive changes and the active participants being mocked at and some other challenges. In order to conquer these challenges, the principals had unleashed their potentials to the highest degree incorporating the productivity into proficiency in education; creating an attractive atmosphere in the school, accepting criticism as blessings